# අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීම (EOI)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# පරිසර අමාත්‍යාංශය

**ප්‍රසම්පාදන අස්තිත්වයේ නම:**
ශ්‍රී ලංකාව තුළ මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය, ජාතික ඕසෝන් ඒකකය (NOU)

**උපදේශන සේවාව:** ශීතකරණ හා වායුසමන (Refrigeration & Air Conditioning – RAC) සහ ජංගම වායුසමන (Mobile Air Conditioning – MAC) ක්ෂේත්‍රයන්හි නියුක්තිකයින්/කාර්මිකයන් සඳහා හොඳ සේවා පුරුදු පිළිබඳව මාර්ගෝපදේශයක් සකස් කිරීම.

**කොන්ත්‍රාත් අංකය:** ENV/ARM & NOU/04/15/25/2025

පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය විසින්, ඉහත සඳහන් උපදේශන සේවාව සඳහා සුදුසුකම් ලත් සහ පළපුරුද්ද ඇති දේශීය උපදේශකයින්ගෙන් අභිලාෂ ප්‍රකාශ කිරීම් (EOI) ලබා ගැනීමට මෙයින් ආරාධනා කෙරේ.

මෙහිදී, පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය වෙනුවෙන් ව්‍යාපෘති උපදේශන ප්‍රසම්පාදන කමිටුව (CPCP), මෙම දැන්වීමේ විස්තර කර ඇති සේවාවන් සැපයීමට සුදුසුකම් සහ පළපුරුද්ද ඇති උපදේශකයින්ට ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කිරීමට ආරාධනා කරයි. උනන්දුවක් දක්වන උපදේශකයින්, ඉහත උපදේශන කාර්යය ඉටු කිරීමට තමන් සුදුසු බව සහ පළපුරුද්ද ඇති බව සනාථ කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධානයන්, ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් (national & International Standards) සහ හරිත තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ප්‍රතිපත්තියට (Green Technical and Vocational Education (TVET) Policy) අනුකූලව ආරක්ෂිත, බලශක්ති කාර්යක්ෂම සහ පරිසර හිතකාමී ශීතකාරක හා ඒවා අඩංගු උපකරණ හැසිරවීම සඳහා හොඳ සේවා පුරුදු වැඩිදියුණු කිරීම සඳහා ශීතකරණ සහ වායුසමන (RAC) හා ජංගම වායුසමන (MAC) ක්ෂේත්‍රයේ නියුතු නියුක්තිකයින්/

කාර්මිකයන් සඳහා පුළුල්, ප්‍රායෝගික සහ නිදර්ශන සහිත මාර්ගෝපදේශය සකස් කිරීම මෙම උපදේශන සේවාවේ අරමුණයි.

## කාර්යය පරාසය

- දැනට පවතින හොඳ සේවා පුරුදු ක්‍රමවේද (Codes of Good Practices), ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්, හරිත තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ප්‍රතිපත්තිය (Green TVET Policy), ජාතික නිපුණතා සම්මතයන් (National Competency Standards), විෂය මාලාවන් සහ පුහුණු දත්ත සංග්‍රහ අධ්‍යයනය කිරීම.
- තෘතීය වෘත්තීය හා අධ්‍යාපන කොමිසන් සභාව (TVEC), ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA), වෘත්තීය පුහුණු අධිකාරිය (VTA), ශ්‍රී ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය (CGTTI), කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET), වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය (UNIVOTEC), කාර්මික සංගම් සහ ජාතික ඕසෝන් ඒකකය (National Ozone Unit) ඇතුළුව ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ උපදේශන සැසි පැවැත්වීම.
- ශීතකරණ සහ වායුසමන (RAC) හා ජංගම වායුසමන (MAC) ක්ෂේත්‍රයේ නියුක්තිකයින්/ කාර්මිකයන්ගේ ප්‍රධාන තාක්ෂණික ක්ෂේත්‍ර හඳුනා ගැනීම.
- ස්ත්‍රී-පුරුෂ සමානත්ව ක්‍රියාවලිය පිළිබඳව ඒකාබද්ධ කිරීම
- එක් (1) පාර්ශවකාර වැඩමුළුවක් (stakeholder workshop) සහ එක් (1) වලංගුගත කිරීමේ වැඩමුළුවක් (validation workshop) පැවැත්වීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජාතික පුහුණු පද්ධතිවලට ඒකාබද්ධ කිරීම.
- තාක්ෂණවේදීන්/පුහුණුකරුවන් සඳහා පහසු, දෘශ්‍යමය (illustrated) සහ පුහුණු අනුකූල මාර්ගෝපදේශයක් (guideline) ප්‍රවර්ධනය කිරීම.

## කාලසීමාව

මෙම කාර්යය කොන්ත්‍රාත් අත්සන් කරන දිනයේ සිට මාස 3 කාලයක් තුළ ක්‍රියාත්මක කළ යුතුය.

## උපදේශනය සඳහා අවශ්‍ය සුදුසුකම්:

- යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ BSc (ගෞරව) උපාධියක් හෝ ශීතකරන හා වායු සමන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් තිබීම හෝ ඒ ආශ්‍රිත තාක්ෂණික ක්ෂේත්‍රයක් වීම.
- අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකමක් අමතර වාසියක් වනු ඇත.

- සේවා සැපයීම, නඩත්තු කිරීම හෝ තාක්ෂණික අධීක්ෂණය ඇතුළුව ශීතකරණ සහ වායුසමන (RAC) හා ජංගම වායුසමන (MAC) ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 3 ක වෘත්තීය පළපුරුද්දක් තිබීම.
- නියුක්තිකයින්/කාර්මිකයන් සඳහා පුහුණු ද්‍රව්‍ය, තාක්ෂණික මාර්ගෝපදේශ, අත්පොත් හෝ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමේ හැකියාව
- තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පද්ධතිය , ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය පිළිබඳව දැනුම.
- ස්ත්‍රී-පුරුෂ සමානත්වය ප්‍රවර්ධනය කිරීමේ මූලධර්ම පිළිබඳව දැනුම.
- ශක්තිමත් විශ්ලේෂණාත්මක, වාර්තා ලිවීමේ, සන්නිවේදනය සහ පහසුකම් සැපයීමේ කුසලතා.
- තාක්ෂණික අන්තර්ගතයන් පරිශීලක-හිතකාමී, නිදර්ශන මාර්ගෝපදේශ බවට සරල කිරීමේ හැකියාව.

## තෝරා ගැනීමේ ක්‍රමය:

උපදේශකයන් තෝරා ගැනීම උපදේශකයින්ගේ ගුණාත්මකභාවය සහ පිරිවැය පාදක තෝරා ගැනීමේ (QCBS) ක්රමවේදය ප්රකාරව, ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය මගින් ප්රකාශිත උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීම සදහා මාර්ගෝපදේශවට අනුකූලව සිදු කෙරේ.

## වැඩිදුර තොරතුරු:

උනන්දුවක් දක්වන උපදේශකයින්ට අවශ්‍ය වැඩිදුර විස්තර/ පැහැදිලි කරගැනීම්, 0112034222 දුරකථන අංකය හරහා හෝ nousrilanka@nou.lk/techteam@nou.lk ඊ-තැපැල් ලිපින හරහා 25.05.2026 දින සිට 09.06.2026 දින දක්වා, රාජකාරි දින වල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 අතර කාලය තුළ විමසිය හැකිය.

## අභිලාෂ ප්රකාශ කිරීම් (EOI) ඉදිරිපත් කිරීම:

නිසි පරිදි සම්පූර්ණ කර ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද, මුද්‍රා තැබූ අභිලාෂය ප්රකාශ කිරීමේ (EOI) ලේඛන, පහත සදහන් ලිපිනය වෙත 09.06.2026 දින ප.ව. 2.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ

වම් ඉහළ කෙළවරේ "උපදේශන ප්‍රසම්පාදනය සඳහා අභිලාෂ ප්‍රකාශ කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන EOI ලේඛන ප්‍රතික්ෂේප කෙරේ. අභිලාෂය ප්‍රකාශ කිරීම් (EOI) ලේඛන විවෘත කිරීම 09.06.2026 දින ප.ව. 2.00 ට ආරම්භ කෙරේ.

**ලේඛන ලබා ගැනීම:**

අදාළ යොමු කිරීමේ අනුදේශ (Terms of Reference) සහ අභිලාශ ප්‍රකාශ කිරීම් ආකෘතිය (EOI) අපගේ www.env.gov.lk නිල වෙබ් අඩවියෙන් හෝ QR කේතයෙන් බාගත කළ හැකිය.

සභාපති, ව්‍යාපෘති උපදේශන ප්‍රසම්පාදන කමිටුව
**ජාතික ඕසෝන් ඒකකය, 7 වන මහල, පරිසර අමාත්‍යාංශය, "සොබාදම් පියස", අංක 416/C/1. රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.**

**24.05.2026**
**දිනය**